# ජාතික ලුණු සමාගම

## කර්මාන්ත අමාත්‍යාංශය

**ජාතික ලුණු සමාගම යනු කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන රජයට අයත් සමාගමකි. අපගේ කොළඹ ප්‍රධාන කාර්යාලයේ හා මන්නාරම හා අලිමංකඩ (කිලිනොච්චිය) පිහිටි ලුණු ලේවායන්වල පවත්නා පහත සඳහන් තනතුරු ස්ථිර පදනමින් පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

### කළමනාකරු - පරිපාලන - (MM-I-I)
**(තනතුරු 01 - ප්‍රධාන කාර්යාලය, කොළඹ)**

**අවශ්‍ය සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන / රාජ්‍ය කළමනාකරණ / ව්‍යාපාර කළමනාකරණ / රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සහ උපාධිය ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

01. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම,

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමනාකරු (JM 1-1) වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-1-2016 රුපියල් (53,175–10x1,375–15x1,910 – 95,575) හා අනෙකුත්, ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/– සහ විශේෂ දීමනාව රුපියල් 5,000/– ආදී රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

### කළමනාකරු - පිරිවැය ගිණුම්කරණ - (MM I-I)
**(තනතුරු 01 - ප්‍රධාන කාර්යාලය, කොළඹ)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ගණකාධිකරණ / වාණිජ්‍ය / ව්‍යාපාර කළමනාකරණ / ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සහ උපාධිය ලබාගත් පසුව රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත් වීම සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අවම වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

01. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම,

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM 1-1) වර්ගීකරණයේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-1-2016 රුපියල් (53,175–10x1,375–15x1,910 – 95,575) හා අනෙකුත්, ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/– සහ විශේෂ දීමනාව රුපියල් 5,000/– ආදී රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

### සහකාර කළමනාකරු - ලුණු ලේවාය (JM I-I)
**(තනතුරු 02 - අලිමංකඩ, කිලිනොච්චිය)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

01. අදාළ ක්ෂේත්‍රයේ විද්‍යා / කළමනාකරණ / NVQ-7 ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ NVQ-6 තලය සහතිකයක් සමග වසර පහක (5) පළපුරුද්ද හෝ NVQ-5 තලය සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

01. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණ විද්‍යා (MA 2) II ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** JM 1-1 - 2016 රුපියල් (42,600 – 10x755 – 18x1,135 – 70,580/–) සහ අනෙකුත්, ජීවන වියදම් දීමනාව රුපියල් 7,800 සහ විශේෂ දීමනාව රුපියල් 5,000/– ආදී රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

### සහකාර කළමනාකරු - තත්ත්ව පාලන (JM 1-1)
**(තනතුරු 01 - මන්නාරම)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

01. විද්‍යා / කළමනාකරණ / තත්ත්ව පාලන විෂයයේ NVQ-7 තලයේ සහතිකයක් හෝ තත්ත්ව කළමනාකරණ NVQ-6 තලයේ සහතිකයක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (5) පළපුරුද්ද හෝ තත්ත්ව කළමනාකරණ විෂය NVQ-5 තලයේ සහතිකයක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණවිද්‍යා (MB2) ශ්‍රේණිය II තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :** JM 1-1 - 2016 - රුපියල් (42,600 – 10x755 – 18x1,135 – 70,580) හා අනෙකුත්, ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/– සහ විශේෂ දීමනාව රුපියල් 5,000/– ආදී රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

### ලුණු ලේවා නිලධාරී - (MA 2-1)
**(තනතුරු 01- අලිමංකඩ, කිලිනොච්චිය)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

01. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

01. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබාතිබීම.

හෝ

02. අ.පො.ස. (උ/පෙළ) සමත්ව, ක්ෂේත්‍රයට අදාළව PL-3 නිලධාරියකු ලෙස වසර තුනක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** JM 1-1-2016 රුපියල් (30,310 – 10x300 – 7x350 – 4x495 – 20x660 – 50,940/–) හා අනෙකුත්, ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/– සහ විශේෂ දීමනාව රුපියල් 5,000/– ආදී රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

### කළමනාකරණ සහකාර - (MA I-I)
**(ස්ථිර පදනමින්)**

**කොළඹ මූල්‍ය අංශය සඳහා තනතුරු 02**
**අලිමංකඩ මූල්‍ය අංශය සඳහා තනතුරු 01 සහ**
**කොළඹ IT දෙපාර්තමේන්තුව සඳහා තනතුරු 01**

**අවශ්‍ය මූලික සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

01. අ.පො.ස. (සා/පෙළ) විභාගය,
    - සිංහල / දෙමළ
    - ඉංග්‍රීසි භාෂාව (තනතුරුට අදාළ වෙතොත්)
    - ගණිතය

    ඇතුළත්ව විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සමග විෂයයන් හයකින් එක් වරකදී සමත්ව සිටීම සමග, අදාළ ක්ෂේත්‍රයේ යතුරුලියනය / පරිගණක දැනුම.

02. අ.පො.ස. (උ/පෙළ) විභාගය (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනකින් සමත්වීම සහ අදාළ ක්ෂේත්‍රයේ යතුරුලියන / පරිගණක දැනුම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

පහත සඳහන් සුදුසුකම් සහිත ප්‍රාථමික තලයේ – පුහුණු, ප්‍රාථමික තලයේ – අර්ධ පුහුණු හා ප්‍රාථමික තලයේ – නුපුහුණු වර්ගීකරණයේ සේවකයන් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

**අධ්‍යාපනික :**

අ.පො.ස. (සා/පෙළ) විභාගය,
- සිංහල / දෙමළ
- ඉංග්‍රීසි භාෂාව (තනතුරට අදාළ වෙතොත්)
- ගණිතය

ඇතුළත්ව විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ හතරක් සමග විෂයයන් හයකින් සමත් වීම

සහ

ඉහත සේවක වර්ගීකරණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කොට තිබීම.

සටහන : ඉහත ප්‍රාථමික සුදුසුකම්වලට අමතරව :

- මූල්‍ය අංශයේ තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන්, අ.පො.ස. (උ/පෙළ) වාණිජ ධාරාවේ විභාගයේදී ගිණුම් විෂය විෂයයක් ලෙස සමත්ව තිබිය යුතුය. AAT හෝ අනෙකුත් ගිණුම් පැකේජ සම්පූර්ණ කොට තිබීම අමතර වාසිදයක වනු ඇත.
- IT දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා අපේක්ෂිත අයදුම්කරුවන්, IT ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා සහතික ලබා තිබිය යුතුය.

වැටුප් පරිමාණය : MA I-1 - GR - III - 2016 – රුපියල් (27,910 – 10x300 – 7x350 – 4x495 – 20x660 – 48,540/–) හා අනෙකුත්, ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/– සහ විශේෂ දීමනාව රුපියල් 5,000/– ආදී රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

### සුපරීක්ෂක - (PL-3)
**(තනතුරු 04 - ස්ථිර පදනමින් -**
**අලිමංකඩ, කිලිනොච්චිය හා මන්නාරම ලුණු ලේවායන් සඳහා)**

**අවශ්‍ය සුදුසුකම් :**

**වෘත්තීය :**

එක් එක් තනතුරෙහි ක්‍රියාකාරීත්වයට අදාළව, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයක් විසින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් හතර (04) තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

01. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම,

හෝ

අදාළ ක්ෂේත්‍රයේ අවම වසර පහක (05) කාර්ය පළපුරුද්දක් සම්පූර්ණ කළ හා වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කළ ජාතික වෘත්තීය සුදුසුකම් දෙක තලයට (02) නොඅඩු නිපුණතා සහිත ප්‍රාථමික තලයේ අර්ධ පුහුණු (PL 2) හෝ නුපුහුණු (PL 1) සේවකයන්.

**වැටුප් පරිමාණය :** PL 3 - 2016 - රුපියල් (26,290 – 10x270 – 10x300 – 10x330 – 12x350 – 39,490/–) හා අනෙකුත්, ජීවන වියදම් දීමනාව රුපියල් 7,800/– සහ විශේෂ දීමනාව රුපියල් 5,000/– ආදී රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

**ස්ථිර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව :**

වයස අවුරුදු 18 අඩු නොවිය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට හෝ ස්ථිර රජයේ නිලධාරීන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**අනෙකුත් කරුණු :**

**සෑම අයදුම්කරුවකුම :**

i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii) තනතුරේ රාජකාරී නිසි අයුරු සිදු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි අයුරු ඉහළ මානසික හා ශාරීරික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(අදාළ පරිවාස කාලය වසර තුනක් වේ)

කරුණාකර, ඔබගේ අයදුම්පත්, සහතිකවල පිටපත් සහිතව, ලියාපදිංචි තැපෑලෙන් 2023.01.10 දිනට පෙර යොමු කරන්න.

**සභාපති,**
**ජාතික ලුණු සමාගම,**
**කර්මාන්ත අමාත්‍යාංශය,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**

අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුරෙහි ශීර්ෂය සඳහන් කළ යුතුය.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි.